සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

# ඉතිහාසය

**06 ශ්‍රේණිය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- **අංක 1 සිට 05 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01 ඉතිහාසය ඉගෙන ගැනීමේ දී ප්‍රයෝජනයට ගන්නා පැරණි පොත් පත් හා ජනකතා .......................................... ..............................................මූලාශ්‍රය වලට අයත් වේ. ( සාහිත්‍යය / පුරාවිද්‍යාත්මක / සෙල්ලිපි)

02 ක්‍රි. ව. 12 වන සියවසේ දී පළමුවන පරාක්‍රමබාහු රජතුමා විසින් නිර්මාණය කරවන ලද .................................. ................................................................ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයකට නිදසුනකි. (ලෝවාමහා ප්‍රාසාදය / පොළොන්නරුව ගල්විහාරය / සීගිරිය)

03 මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කර ඇත්තේ ක්‍රිස්තුන් වහන්සේ උත්පත්තිය ලැබීමට අවුරුදු දෙසියපනහකට පෙරය. එම කාලය .................................................................................. ලෙස සැලකේ. ( ක්‍රිස්තු වර්ෂ / බුද්ධ වර්ෂ / ක්‍රිස්තු පූර්ව )

04 ජීවත්වීම සඳහා විවිධ වටිනාකමකින් යුක්ත දෑ නිපදවූ මිනිසාගේ ළඟම ඥාතියා ............................................. ................................................ මානවයා වේ. (හෝමෝ හැබිලස් / හෝමෝ සාපියන් / හෝමෝ ඉරෙක්ටස්)

05 ලෝකයේ බිහිවූ ඉපැරණි ශිෂ්ටාචාර අතරින් ......................................................... ගංගා නිම්නයේ පිහිටියේ මෙසපොතේමියානු ශිෂ්ටාචාරයයි. (නයිල් / හොවැංහෝ / යුප්‍රටීස්)

- **අංක 6 - 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.**

06 මීට අවුරුදු මිලියන දෙදහස් පන්සියයකට පෙර පෘථිවියේ පළමුවෙන්ම බිහිවූ ජීවියා බැක්ටීරියාවකි. ( )

07 චීනය, ඉන්දියාව, මධ්‍යම මෙක්සිකෝව යන ප්‍රදේශ අතරින් ලෝකයේ වී වගාව පළමුවෙන්ම ආරම්භ කළ රට ඉන්දියාවයි. ( )

08 දූව දඬු හා කොළ අතු භාවිතා කරමින් මිනිසා නිවාස සාදාගෙන එකම ස්ථානයක දිගුකාලයක් රැඳී සිටීම සිදු වූයේ මධ්‍ය ශිලා යුගයේ දීය. ( )

09 ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ජීවත් වූ ගිල්ග-මේෂ් නමැත්තා විසින් කූන්‍ය අක්ෂර භාවිතයෙන් ලියන ලද වීර කාව්‍ය ලෝකයේ පැරණිම සාහිත්‍ය කෘතිය ලෙස සැලකේ. ( )

10 පුරාණ කාලයට අයත් මැටියෙන් සාදන ලද දෑකැත්තක් ඊශ්‍රායලයෙන් හමු වී ඇත. ( )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

11 පැරණි ශිෂ්ටාචාරවලින් ලෝකයට විවිධ දායාද උරුම වී ඇත. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් ලද උරුමයක් වන්නේ මින් කුමක් ද?

(1) නගර සැලැස්ම (2) ගණිත ක්‍රම (3) ගොඩනැගිලි (4) චිත්‍රාක්ෂර

12 ගින්දර භාවිතයට හුරුවීම මිනිසාගේ දියුණුවේ සුවිශේෂී අවස්ථාවකි. පළමු වරට ගින්දර භාවිතය පිළිබඳ සාක්ෂි ලැබෙන රට මින් කුමක් ද?

(1) චීනය (2) ඊශ්‍රායලය (3) ඊජිප්තුව (4) ඉන්දියාව

13 සාහිත්‍යය මූලාශ්‍රයක් වූ මහා වංශය රචනා කළ කතුවරයා මින් කවරෙක් ද?

(1) බුද්ධ ඝෝෂ හිමි (2) ශ්‍රී රාහුල හිමි (3) ශ්‍රී සුමංගල හිමි (4) මහානාම හිමි

14 පොළොවට අධිපති දෙවියන් එන්කිකි නමින් හඳුන්වා ඇති ශිෂ්ටාචාරය මින් කුමක් ද?

(1) චීනය (2) ඊජිප්තුව (3) මෙසපොතේමියාව (4) ඉන්දු නිම්නය

15 බෙලිකටුවක් විද සකස් කරගත් ගෙලෙහි බඳින තැල්ලක් හමු වී ඇති ස්ථානය මින් කුමක් ද?

(1) කිතුල්ගල බෙලි ලෙන (2) පාහියන්ගල ලෙන

(3) බටදොඹ ලෙන (4) මානියම්ගම ලෙන

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.**

16 මහා වංශයේ සඳහන් වන පරිදි විජය කුමරු ඇතුළු පිරිස ශ්‍රී ලංකාවේ...................................................... ඔය ආශ්‍රිතව ජනාවාස පිහිටුවාගෙන ඇත.

17 අප්‍රිකානු මහාද්වීපයේ බිහිවූ ඊජිප්තු ශිෂ්ටාචාරය දීර්ඝ කාලයක් පාලනය කර ඇති රජ පෙළපත ................................................................ නමින් හැඳින් වේ.

18 වෙළෙඳාමෙහි නිරතවූ මෙසපොතේමියානු වැසියෝ ගංගාවල භාණ්ඩ ප්‍රවාහනය සඳහා ............................................................. යොදා ගත්හ.

19 දැනට අවුරුදු මිලියන පන්සිය හතළිස් දෙකකට පෙර කැනඩාවෙන් සොයාගෙන ඇති සත්ව සලකුණ ....................................................... නමින් හැඳින් වේ.

20 විශාල සතුන්ගේ ඇටකටු භාවිතා කරමින් නිවාස ඉදිකිරීම හා එළවළු වර්ග පිස ආහාරයට ගැනීමට හුරුවූ .................................................... මානවයා දක්ෂ දඩයක්කාරයෙක් ද විය.

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01.




(i) ඉහත සිතියමේ A B C අක්ෂර වලින් පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර 3ක් දැක්වේ. එම ශිෂ්ටාචාර තුන නම් කරන්න.

(අ) A - ...................... (ආ) B - ...................... (ඇ) C - ...................... (ල. 03)

(ii) එම ශිෂ්ටාචාර පිහිටි ගංගා නිම්න ලියන්න.

(අ) A - ...................... (ආ) B - ...................... (ඇ) C - ...................... (ල. 03)



(iii) (අ) මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ දක්නට ලැබෙන ආගමික ස්ථානයකි. එය කුමක් ද? (ල. 01)

(ආ) එය පිහිටි නගරය කුමක් ද? (ල. 01)

(ඇ) දේව මණ්ඩලයේ ප්‍රධානියා ලෙස මෙසපොතේමියානු වැසියෝ සැලකුයේ කුමන දෙවියන්ද ? (ල. 01)

(ඈ) මෙසපොතේමියානු වැසියන් සුළඟට හා ගොවිතැනට අධිපති දෙවියන් හැඳින්වූයේ කුමන නමින් ද? (ල. 01)



(iv) (අ) මෙම පින්තූරයේ දැක්වෙන නිර්මාණය හැඳින්වෙන නම කුමක්ද? (ල. 01)

(ආ) ඔහු උසස් පුද්ගලයෙකු ලෙස දැක්වීමට යොදා ඇති සංකේතය කුමක් ද? (ල. 01)

(ඇ) මෙම මූර්තිය ඇස් අඩවන් වන ආකාරයට නෙලා තිබීමෙන් පෙන්නුම් කිරීමට උත්සාහ දරා ඇත්තේ කුමක් ද? (ල. 01)

(v) (අ) මෙම පින්තූරයේ දැක්වෙන ගොඩනැගිලි මොනවාද?

(ල. 01)



(ආ) මෙම ගොඩනැගිලි පිහිටා ඇත්තේ කුමන ස්ථානයක ද?

(ල. 01)

(ඇ) මෙම ස්ථාන සිහිවටන ලෙස සැලකිය හැක්කේ කුමන කරුණක් සම්බන්ධයෙන් ද? (ල. 01)

02 (i) ඔබේ පාසලේ ඉතිහාසය දැන ගැනීමට උපකාරිවන මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ල. 02)



(ii) A මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?

B මෙය නිර්මාණය කිරීමට භාවිතා කරන ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.


C මෙම නිර්මාණය සිදුවූයේ කුමන යුගයේ ද? (ල. 04)

(iii) වානරයා මිනිසකු ලෙස නිර්මාණය වීමේ දී පසු කළ විවිධ අවස්ථාවලදී හඳුන්වන ලද නම් පිළිවෙලින් දක්වන්න.

(ල. 05)

(ල. 11)

03 (i) ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගෙන ලංකාවට පැමිණි පිරිස ගොඩබට ස්ථානය කුමක් ද? (ල. 02)



(ii) A මෙම පින්තූරයේ දැක්වෙන නිර්මාණය කුමක් ද?

B මෙය කර වූ රජතුමා නම් කරන්න.

C මෙය නිර්මාණය කර ඇති හැඩය කුමන නමකින් හැඳින්වේ ද?

D මෙම ස්තූපය ආශ්‍රිත සුවිශේෂී ලක්ෂණය කුමක් ද? (ල. 04)

(iii) **පහත සඳහන් තොරතුරු ගැලපෙන පරිදි යා කරන්න.**

| | **A** තීරුව | **B** තීරුව |
|---|---|---|
| 1. | රාජකකුධ භාණ්ඩ ලබා දීම | සංඝමිත්තා තෙරණිය |
| 2. | බුදු දහම රැගෙන ඒම | දේවානම් පියතිස්ස රජු |
| 3. | මුටසීව රජුගෙන් පසු රජවීම | අනුලා දේවිය |
| 4. | ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගෙන ඒම | මිහිඳු හිමි |
| 5. | ලංකාවේ මෙහෙණිසස්න ආරම්භ වීම | ධර්මාශෝක රජු |
| | | වසභ රජු |

(ල. 05) (ල. 11)

04 මිනිසාගේ දියුණුව පිළිබිඹු කරන ඉතා වැදගත් අවස්ථාවක් ලෙස ශිෂ්ටාචාර බිහිවීම දැක්විය හැකිය.

(i) මෙසපොතේමියානු සමාජය බෙදී ගිය කොටස් හතර නම් කරන්න. (ල. 04)

(ii) පහත දැක්වෙන වගුවේ ඇති තොරතුරු වලට අදාළ නිවැරදි පිළිතුර තිත් ඉරි මත ලියන්න.

| A | B |
|---|---|
| 1. මෙසපොතේමියාවේ උතුරු ප්‍රදේශයේ ජීවත් වූ අය | ........................................ |
| 2. රජවරුන්ගේ මළ සිරුරු තැන්පත් කිරීම | ........................................ |
| 3. පැරණිතම අක්ෂර පද්ධතිය | ........................................ |
| 4. ලෝකයේ පැරණිතම නීතිය | ........................................ |
| 5. රූප භාවිතයෙන් නිර්මාණය කළ අක්ෂර | ........................................ |
| 6. මළ සිරුරු කල්තබා ගැනීම | ........................................ |
| 7. බූරුවා පිට බඩු පටවාගෙන යාම | ........................................ |

(කූනාෘ අක්ෂර , තවලම, ඇසිරියන්, මමීකරන්, පිරමීඩ, හමුරාබි නීතිය, චිත්‍රාක්ෂර, සිගුරට්) (ල. 07)

05 (i) පණ්ඩුකාභය රජතුමාගේ නගර නිර්මාණයේ ලක්ෂණ හතරක් ලියන්න. (ල. 04)

(ii) පණ්ඩුකාභය රජතුමාගෙන් ඔබට ගත හැකි ආදර්ශ හතරක් දක්වන්න. (ල. 04)

(iii) පහත තොරතුරු වලට අදාළ නිවැරදි පිළිතුර ඉදිරියෙන් ලියන්න.

(අ) පණ්ඩුකාභය රජු පිහිටුවාගත් පාලන මධ්‍යස්ථානය කුමක් ද?

(ආ) බසවක්කුලම වැව අතීතයේ හැඳින්වූ නම කුමක් ද?

(ඇ) ආගමික සහජීවනය ඇතිකිරීම සඳහා පණ්ඩුකාභය රජු කළ කාර්යයක් දක්වන්න. (ල. 03)

06 (i) ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස වල ජීවත් වූ වැසියන් එදිනෙදා කටයුතු වලට අවශ්‍ය වන මෙවලම් සෑදීමට ගල් වලට අමතරව භාවිතා කළ ද්‍රව්‍ය 02 ක් නම් කරන්න. (ල. 02)

(ii) විජය කුමරු මෙරටට පැමිණෙන අවධියේ මෙරට සිටි ජනතාව ක්‍රමවත් තාක්ෂණ දියුණුවක් ලබා සිටි ක්ෂේත්‍ර තුනක් දක්වන්න. (ල. 03)

(iii) විජය කුමරු සමඟ ලංකාවට පැමිණි ඇමතිවරු දෙදෙනෙක් පහත A B අක්ෂරවලින් දක්වා ඇත. ඔවුන් පිහිටුවා ගත් ජනාවාස 1 බැගින් එම අක්ෂර ඉදිරියෙන් ලියා දක්වන්න.

A උපතිස්ස ඇමති -

B අනුරාධ ඇමති - (ල. 04)

(iv) මෙරට පැරණි ජනතාව අනුගමනය කළ අවමංගල්‍ය චාරිත්‍ර දෙකක් දක්වන්න. (ල. 02)

07 (i) දේවානම් පියතිස්ස රජු මිහිඳු හිමි ඇතුළු පිරිසට පූජාකළ උයන හා ආරාමය නම් කරන්න. (ල. 02)

(ii) දේවානම් පියතිස්ස රජු විසින් කරන ලද කාර්යයන් කීපයක් පහත දැක්වේ. එම කාර්යයන් ට ගැලපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

- ⋆ ඉගෙනීමේ කටයුතු වලට අවශ්‍ය පිරිවෙන් පිහිට වූ ප්‍රදේශය -
- ⋆ අනුරපුර නගර සීමාව ලකුණු කිරීමට යොදාගත් ඇතුන් දෙදෙනා -
- ⋆ මිහිඳු හිමි ඇතුළු පිරිසට වාසය කිරීමට ඉදිකළ ලෙන් -

(මහා පදුම, කඩොල්, කුංජ, මහමෙවුනා, මහා විහාරය, අටසැට ලෙන්, ගිරි ලෙන්) (ල. 03)

(iii) පහත සඳහන් උපකාරක පද උපයෝගී කරගෙන ප්‍රහේළිකාව සම්පූර්ණ කරන්න.

**හරහට**

1. ලංකාවට බුදු දහම රැගෙන ආවේ මෙතුමා විසිනි.
2. දේවානම් පියතිස්ස රජු භික්ෂූන් වහන්සේලාට දානය වැළඳීමට සැදූ දාන ශාලාව
3. මහින්දාගමනයට එක් වූ සාමණේරහිමියන් හඳුන්වන නම

**පහළට**

1. මිහිඳු හිමියන් ඇතුළු පිරිස මෙරටට වැඩම කළ ස්ථානය
2. මහින්දාගමනයට එක් වූ රහතන් වහන්සේ නමකි.
3. දේවානම් පියතිස්ස රජු ධර්මාශෝක රජුට යැවූ දූත පිරිසේ නායකයා හඳුන්වන නම.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 මි | | | | 3 සු | | |
| | | | | | | |
| | | 2 ස | | | | 3 අ |
| | | | | | | |
| 2 ල | | | | ගේ | | |
| | | | | | | ඨ |

(ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. සාහිත්‍ය 02. පොළොන්නරුවේ ගල් විහාරය 03. ක්‍රිස්තු පූර්ව 04. හෝමෝ සාපියන් 05. යුප්‍රටීස්
06. (✓) 07. (✗) 08. (✓) 09. (✗) 10. (✓) 11. (1) 12. (2) 13. (4) 14. (3)
15. (2) 16. මල්වතු 17. පාරාවෝ 18. නැව් 19. ඔපබීනියා 20. හෝමෝ නියැන්ඩතාලන්සිස්

(2 x 20 = ල. 40)

## II කොටස

01. (i) (අ) A - මෙසපොතේමියාව (ආ) B - ඉන්දු නිම්න
(ඇ) C - ඊජිප්තු ශිෂ්ටාචාරය (නයිල් නිම්න) (ල. 03)
(ii) (අ) A - යුප්‍රටීස් ටයිග්‍රීස් (ආ) B - සින්දු
(ඇ) C - නයිල් (ල. 03)
(iii) (අ) සිගුරත් (ආ) ඌර් (ඇ) අනු
(ඈ) එන්ලිලි (ල. 04)
(iv) (අ) පූජකවරයෙක් (ආ) නළලේ දක්නට ඇති පටිය
(ඇ) සන්සුන්ව භාවනාවේ සිටින බව (ල. 03)
(v) (අ) පිරමීඩ (ආ) ගීසා නැමති ස්ථානය
(ඇ) පාරාවෝ (ල. 03) (ල. 16)

02. (i) • ලොග් සටහන් පොත • සමරු පලක • සිසුන් ඇතුලත් කිරීමේ ලේඛනය
• නාම ලේඛන (ල. 02)
(ii) A තාවකාලික පැල්පත (ල. 01) B ලීදඬු, කොළ අතු (ල. 02)
C මධ්‍ය ශිලා යුගය (ල. 01)
(iii) ඔස්ට්‍රලෝපිතිකස්, හෝමෝහැබිලිස්, හෝමෝ ඉරෙක්ටස්, හෝමෝ නියැන්ඩතාලෙන්සිස්,
හෝමෝසාපියන් (ල. 05)

03. (i) දඹකොළ පටුන (ල. 02)
(ii) A ථූපාරාමය B දේවානම්පියතිස්ස රජු C ධාන්‍යාගාර හැඩ D දකුණු අකුධාතුව (ල. 04)
(iii) 1 - ධර්මාශෝක රජතුමා 2. මිහිඳු හිමි 3. දේවානම්පියතිස්ස රජු
4. සංඝමිත්තා තෙරණිය 5. අනුලා දේවි (ල. 05)

04. (i) 1. පූජකයන් 2. ඉහළ පංතිවලට අයත් වැසියන්
3. පහළ පංතිවලට අයත් වැසියන් 4. වහලුන් (ල. 04)
(ii) 1. ඇපිරියන් 2. පිරමීඩ 3. කූන්‍ය අක්ෂර 4. හමුරාබි නීතිය 5. චිත්‍රාක්ෂර 6. මමීකරණ 7. තවලම (ල.07)

05. (i) ⋆ නගරයේ ආරක්ෂාවට දිය අගල් තැනවීම ⋆ ප්‍රධාන දිසා හතරේ දොරටු 4 ක් ඉදිකිරීම
⋆ එම දොරටු සම්බන්ධ කර මාර්ග පද්ධතියන් ඉදිකිරීම ⋆ උද්‍යාන පොකුණු ඉදිකිරීම (36 පිටුව) (ල. 04)
(ii) • අභියෝග වලට මුහුණ දීම • දුක්කම්කටොලු විඳ දරා ගැනීම • ස්ථානෝචිත ප්‍රඥාව
• ජයග්‍රහණ භුක්තිවිඳීම (ල. 04)
(iii) A - අනුරාධපුරය B - අභයවැව
C - දේවාල ගොඩනැගීම, ආගමික ගොඩනැගිලි ඉදිකිරීම (ල. 03) (ල. 11)

06. (i) ඇටකටු, ලී (ල. 02)
(ii) ⋆ ගල්මෙවලම් වෙනුවට යකඩ ලෝහය භාවිතා කිරීම
⋆ මැටි වළං සෑදීම ⋆ වහල කොළ අතු සෙවිලි කොට වරිච්චි ගෙවල් සෑදීම (ල. 03)
(iii) A - උපතිස්සගාම B - අනුරාධගාම (ල. 04)
(iv) ⋆ මළ සිරුරු කිසියම් තැනක වැළලීම ⋆ පසුව ගොඩට ගෙන ආදාහනය කිරීම
⋆ මිනී අළු මැටියෙන් සෑදූ මුට්ටියක දමා සොහොනක තැන්පත් කිරීම (ල. 02)

07. (i) මහමෙවුනා උයන, තිස්සාරාමය (ල. 02)
(ii) ⋆ මහාවිහාරය ⋆ මහා පදුම සහ කුංජ ⋆ අටසැට ලෙන් (ල. 03)
(iii) හරහට
1. මිහිඳු 2. ලහබත්ගේ 3. සුමන
පහළට
1. මිහින්තලය 2. සම්බල 3. අරිට්ඨ (ල. 06)